# යාළු මාළුවා



කතෘගේ නම
එස්.එම්. යෙනුලි බිමන්සා බංඩාර

# යාළු මාළුවා



කතෘගේ නම

එස්.එම්. යෙනුලි බිමන්සා බංඩාර

# යාළු මාළුවා

කතාව සහ චිත්‍ර
එස්.එම්. යෙනුලි බිමන්සා බංඩාර

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2025 පෙබරවාරි 08

ISBN - 978-624-208-522-7

3 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන, මාගේ සදාදරණීය
විදුහල්පතිතුමිය, පන්තිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියවරුන්වත්,
මා පෝෂණය කරන ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමාපියන්වද,
සහෝදර, සහෝදරියන්වද,
මාගේ මිතුර මිතුරියන් සියළු දෙනාටම මෙම
පොත ආදර ගෞරවයෙන්
යුක්තව පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඥන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එකෝමත් එක ගමක ලස්සන පුංචි නිවසක් තිබුණා. ඒ නිවසේ සිටියා අම්මායි, තාත්තායි, පුංචි දුවයි. ඒ පුංචි දුවගේ නම තමයි මලී. අම්මාගේ නම තමයි මෙත්, තාත්තාගේ නම තමයි කල්ප. තාත්තා හැම තිස්සෙම කරන්නේ වැඩට යන එක අම්මා හැම තිස්සේම කරන්නේ ගෙදර වැඩ. මලීගේ පාසල් නිවාඩුව නිසා මලී සමඟ අම්මා පොළට ගියා. මලී පොළට යද්දි දැක්කා විසිතුරු මසුන් විකුණන වෙළෙන්දෙක්.



මලී එතනට දුවගෙන ගියා. මලී දිහා මාළුවෙක් බලාගෙන සිටියා. ඒ මාළුවා රෝසම රෝස පාටයි. මලීටත් ආස හිතුණා.



අම්මේ, අම්මේ මට මේ පුංචි මාළුවාව අරන් දෙන්න මලී අම්මාට කිව්වා.  කොයි මාළුවාද පුතේ, ඕනේ අම්මා ඇහුවා. මට ඕනෙ රෝස පාට මාළුවාව. මෙන්න මේ මාළුවාව, මේ මාළුවා හරිම ලස්සනයි නේද අම්මේ ? ඔව් පුතේ එයා හරිම ලස්සනයි. අම්මා ඒ මාළුවා මලීට අරන් දුන්නා. මලීට දැන් හරි සතුටුයි.



පොළෙන් බඩුත් අරගෙන මලීයි, අම්මයි මාළුවත් අරගෙන ගෙදර ගියා. මාළු පැටියාව ලස්සන මාළු ටැංකියකට දැම්මා. මලී මාළුවට ලස්සන නමකුත් දැම්මා. මාළුවාගේ නම තමයි රෝසි.



අම්මේ, අම්මේ මාළුවට බඩගිනිද කොහේදෝ, මාළුවට කන්න දෙන්නේ මොනවාද ?

අනේ පුතේ මාළුවට දෙන්න මාළු කෑම ගේන්න බැරි වුනානේ. මාළු කෑම කියන්නේ මොනවාටද අම්මේ ? මාළු කෑම කියන්නේ මාළුවන්ට දෙන කෑම ජාතියක් ඒවා බෝල බෝල චූටි චූටි ඇට ජාතියක්. හරි අම්මේ අපි තාත්තාට කියමු ගෙදර එනකොට අරන් එන්න කියලා. එහෙනම් තාත්තාට ඔයාම කෝල් එකක් අරන් කියන්නකෝ.

හලෝ තාත්තේ,

හලෝ පුතේ ඇයි මොකද ?

තාත්තේ හවසට ගෙදර එනකොට මාළු කෑම අරන් එනවාද ?

ඇයි පුතේ මාළු කෑම ගේන්න කියන්නේ මොනවාටද ?

අම්මයි, මායි පොළට ගිය වේලාවේ මාළුවෙක් ගෙනාවා.

හා හරි පුතේ, හවසට එන කොට අරන් එන්නම්.

හරි තාත්තේ පරිස්සමෙන් එන්න.


134
56789

රෝසි ඔයාට බඩගිනිද. තාත්තා එනකම් ඉවසන්න ඔයාටත් බඩගිනියි කියලා මම දන්නවා. මලීත් මාළු ටැංකිය ලඟට ම වෙලා හිටියා, තාත්තා එනකම්ම.



රෝසි, රෝසි අන්න අපේ තාත්තා එනවා

තාත්තේ, තාත්තේ මාළු කෑම ගෙනාවද?

ඔව් පුතේ,ආ මෙන්න.

කෝ දෙන්න, දෙන්න මලී මාළු කෑම ටිකක් මාළු ටැංකියට දැම්මා.

රෝසි මාළු කෑම ටික ඔක්කොම කෑවා.

රෝසිගේ දැන් බඩත් පිරිලා.

රෝසි මලී ළඟට ගිහිල්ලා වරල් දිග ඇරලා ටැංකියේ එහාට මෙහාට ගියා. මලීටත් දැන් හරි සතුටුයි.

මලී එදා ඉඳන් අම්මායි, තාත්තායි, මාළු යාළුවයි එක්ක සතුටින් ජීවත් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්